



# 2.මෙහෙයුම් පද්ධතිය භාවිතයෙන් පරිගණකයක් වින්‍යාස කිරීම සහ සිටුවම් කිරීම

ර/ඇඹි/චන්ද්‍රිකාවැව ජයන්ති මහ විද්‍යාලය - 8 ශ්‍රේණිය



# පරිගණකයක දිනය,වේලාව,වේලා කලාපය සහ මුදල් ඒකක සිටුවම් කිරීම


# පරිගණකයක දිනය,වේලාව,වේලා කලාපය සහ මුදල් ඒකක සිටුවම් කිරීමේ වැදගත්කම

- මෘදුකාංග ස්ථාපනය කිරීම හෝ යාවත්කාලීන කිරීම.
- මෙහෙයුම් පද්ධතිය යාවත්කාලීන කිරීම.
- මෘදුකාංග බලපත්‍ර සක්‍රිය කිරීම.



# පරිගණකයක දිනය සහ වේලාව

මෙහෙයුම් පද්ධතිය විසින් ගොනු සුරැකීම, ගොනු සෙවීම, සිහි කැඳවීම, ව්‍යාපාර ලිපි යැවීම යනාදියේ දී පරිගණකයේ දිනය සහ වේලාව භාවිත කරන බැවින් පරිගණකයේ දිනය සහ වේලාව නිවැරදිව සකස් කර පවත්වා ගෙන යාම වැදගත් ය.



# පරිගණකයේ දිනය සහ වේලාව වෙනස් කිරීම
# Change Date and Time

**වින්ඩෝස් 10 මෙහෙයුම් පද්ධතිය තුළ දිනය සහ වේලාව වෙනස් කිරීම**

Settings හි දිනය සහ වේලාව වෙනස් කිරීමට

1. Settings කවුළුව විවෘත කර, Time & language icon මත click කරන්න

2. එම් පස ඇති ලැයිස්තුවෙන් Data & Time යන්න තෝරා දකුණු පස ලැයිස්තුවෙන් තමා ජීවත් වන රට තෝරා ගැනීම සඳහා එම රටට අදාළ වේලා කලාපය තෝරා ගන්න.

3. දිනය සහ වේලාව දැක්වෙන ආකෘතිය මත click කරන්න.

4. දිනය සහ වේලාව වෙනස් කරන්න.

5. Setting කවුළුව වසාදමන්න.

**(Start > Settings > Time & language > Date & time)** .

# පරිගණකයක වේලා කලාපය

ජාත්‍යන්තර සම්මතයට අනුව ලෝකයේ රටවල් වේලා කලාපවලට බෙදා ඇත.වේලා කලාප නීතිමය,වාණිජ සහ සමාජ අරමුණු සඳහා අනන්‍ය වූ සම්මත වේලාවන් පවත්වාගේන යයි.




උදා:

ශ්‍රී ලංකාවේ වේලාව පෙ.ව 6.00 වන විට එංගලන්තයේ වේලාව පෙ.ව 1.30 වේ.


# Region and Language Setting

**වින්ඩෝස් 10හි Country or Region Home Location වෙනස් කිරීම**


මගින් රට, ප්‍රදේශය සහ නිවෙස පිහිටි ස්ථානය පිළිබඳ දත්ත වෙනස් කිරීම.

ඔබේ පරිගණකයෙහි Country or Region Home Location වෙනස් කිරීම සඳහා


1. Windows 10හි settings icon මත click කර, අනතුරුව Time & language icon මත click කරන්න.
2. වම් පස ඇති ලැයිස්තුවෙන් Region & language යන්න තෝරා, දකුණු පස ලැයිස්තුවෙන් තමා ජීවත් වන රට (නිද: Sri Lanka) තෝරන්න (පහත තිර පින්තූරය බලන්න).
3. ඔබට දැන් Setting කවුළුව වසා දැමිය හැකිය.



Settings icon
Time &
Language tool
Settings
Windows Settings
Find a setting
System
Display, notifications, apps, power
Devices
Bluetooth, printers, mouse
Network & Internet
Wi-Fi, airplane mode, VPN
Personalization
Background, lock screen, colors
Accounts
Your accounts, email, sync, work, family
ime & language
peech, region, date
Ease of Access
Narrator, magnifier, high contrast
Privacy
Location, camera
Update & security
Windows Update, recovery, backup




Settings
Home
Find a setting
Time & language
Date & time
Region & language
Speech
01
Country or region
Windows and apps might use your country or region to give you local content
Sri Lanka
02
Languages
You can type in any language you add to the list. Windows, apps and websites will appear in the first language in the list that they support
Add a language
English (United States)
Windows display language
Related settings
Additional date, time, & regional settings


Settings
Home
Find a setting
Time & language
Date & time
Region & language
Speech
South Georgia and the South Sandwich Islands
South Sudan
Spain
Sri Lanka
St Helena, Ascension and Tristan da Cunha
Sudan
Suriname
Svalbard
Swaziland
Add a language
English (United States)
Windows display language
Related settings
Additional date, time, & regional settings
03

# මුදල් ඒකක සහ ඒවායේ ආකෘති

පරිගණකයක සාමාන්‍යයෙන් සිටුවම් කර ඇත්තේ මෙහෙයුම් පද්ධතිය නිපද වූ රටේ මුදල් ඒකකයයි.එම නිසා අප රටේ භාවිතයට අදාළ මුදල් ඒකකය අප සකසා ගත යුතුය.




**වින්ඩෝස් 10හි මුදල් වර්ගය වෙනස් කිරීම**


**Windows 10හි මුදල් වර්ගය වෙනස් කරන ආකාරය**

Settingsහි මුදල් වර්ගය වෙනස් කිරීම සඳහා



1. Settings කවුළුව විවෘත කර Change date, time or number formats icon මත click කරන්න
2. Region කවුළුව තුළ ඇති Additional Settings බොත්තම මත click කරන්න.
3. Currency තීරුව තෝරාස මුදල් වර්ගයට අදාළ සංකේතය යතුරුලියනය කරන්න. (උදාහරණයක් ලෙස Rs.) අනතුරුව Apply බොත්තම සහ OK බොත්තම click කරන්න.
4. ඔබට දැන් Setting කවුළුව වසාදැමිය හැකි ය.

අයිකනය මත ක්ලික් කර එහි Windows System යටතේ ඇති Control Panel මත ක්ලික් කරන්න.




Adjust your computer's settings
View by: Category
System and Security
Review your computer's status
Save backup copies of your files with File History
Backup and Restore (Windows 7)
Find and fix problems
Network and Internet
Connect to the Internet
View network status and tasks
Choose homegroup and sharing options
Hardware and Sound
View devices and printers
Add a device
Programs
Uninstall a program
User Accounts
Change account type
Appearance and Personalization
Change the theme
Clock, Language, and Region
Add a language
Change input methods
Change date, time, or number formats
Ease of Access
Let Windows suggest settings
Optimize visual display


Nero BurnRights (32-bit)
Network and Sharing Center
NVIDIA Control Panel
Programs and Features
Recovery
Region
Sound
Speech Recognition
Storage Spaces
Taskbar and Navigation
Troubleshooting
User Accounts


Region
Formats
Location
Administrative
Format: English (United States)
Match Windows display language (recommended)
Language preferences
Date and time formats
Short date:
M/d/yyyy
Long date:
dddd, MMMM d, yyyy
Short time:
h:mm tt
Long time:
h:mm:ss tt
First day of week:
Sunday
Examples
Short date:
4/20/2018
Long date:
Friday, April 20, 2018
Short time:
11:39 AM
Long time:
11:39:45 AM
Additional settings...
OK
Cancel
Apply

Customize Format
Numbers
Currency
Time
Date
Example
Positive:
$123,456,789.00
Negative:
($123,456,789.00)
Currency symbol:
Rs.
Positive currency format:
$1.1
Negative currency format:
($1.1)
Decimal symbol:
.
No. of digits after decimal:
2
Digit grouping symbol:
,
Digit grouping:
123,456,789
Click Reset to restore the system default settings for numbers, currency, time, and date.
Reset
OK
Cancel
Apply




# පරිගණකයක ගොනු ගුණාංග

# ගොනුවක් යනු

පරිගණකය තුල සුරකිනු ලබන ලිපියක්, ගීත කොටසක්,පින්තූරයක් වැනි ඕනෑම දෙයක් ගොනුවක් ලෙස හැදින්විය හැකිය.




## ගොනු ගුණාංග




- ගොනුවේ ප්‍රවර්ගය,ගොනු නාමය,ගොනු දිගුව
- ගොනුව නිර්මාණය කළ දිනය
- ගොනුවේ අයිතිවාසිකම්
- ගොනුවේ විශාලත්වය
- ගොනුව සුරැකි ඇති ස්ථානය
- අවසන් වරට ගොනුවෙහි වෙනස්කම් කළ දිනය

# පරිගණකයක ගොනු ගුණාංග විවෘත කර ගැනීම

- අදාල ගොනුව මතට මුසිකය ගෙන එහි දකුණු බොත්තම යොදන්න.
- ඉන්පසු දිස්වන මෙනුවේ යන විධානය දෙන්න.




ගොනුව සුරැකි ඇති ස්ථානය
ගොනුවේ විශාලත්වය
ගොනුව නිර්මාණය කළ දිනය
K.G.O.Rushika (DF1659) - Action Research Praposal Pro...
General
Security
Details
Previous Versions
G.O.Rushika (DF1659) - Action Research Praposal
Type of file: Microsoft Word Document (.docx)
Opens with: Word 2016
Change...
Location: C:\Users\Oshadhi\Desktop
Size: 35.0 KB (35,846 bytes)
Size on disk: 36.0 KB (36,864 bytes)
Created: Sunday, March 28, 2021, 9:48:05 AM
Modified: Saturday, April 3, 2021, 10:3 AM
Accessed: Today, April 3, 2021, 6:05:41 PM
Attributes: Read-only Hidden Advanced
ගොනුවේ ප්‍රවර්ගය,ගොනු නාමය,ගොනු දිගුව
අවසන් වරට ගොනුවෙහි වෙනස්කම් කළ දිනය

# පරිගණකයක ගොනු සෙවීම
# File Search



පරිගණකයක සුරකින ලද ගොනුවක් පසුව නැවත විවෘත කිරීමට අවශ්‍ය වූ විටෙක එම ගොනුවේ නම හෝ සුරැකි ස්ථානය හෝ අමතක වුව හොත් එම ගොනුව සොයා ගැනීම සඳහා ගොනු සෙවීම (file search) යොදා ගත හැකි ය.

මේ සඳහා විවිධ ක්‍රම මෙහෙයුම් පද්ධතිය තුළ ඇති අතර ගොනුවේ නම (file name), ගොනු දිගුව (file extension), සුරකින ලද දිනය වැනි උපකාරක මගින් ගොනු සොයා ගැනීම උදාහරණ ලෙස දැක්විය හැකි ය.

සාමාන්‍යයෙන් ගොනුවක ප්‍රවර්ගය (file type) අපට අමතක නොවේ. එලෙස ම ගොනු නාමයේ දිගුව (file extension) මගින් ගොනුවේ ප්‍රවර්ගය දක්වන බැවින් එම උපකාරකය භාවිත කර ගොනුවක් සොයන ආකාරය ක්‍රියාකාරකමක් ලෙස කර බලමු.

# ගොනු ගුණාංගවල ප්‍රයෝජන

- ගොනුව දර්ශනය නොවී සඟවා තබා ගැනීම කළ හැකිය.
- ගොනුව ආරක්ෂා කරගැනීමේ ක්‍රියාවක් ලෙස අන් අයට ගොනුව දර්ශනය වුව ද සංස්කරණය කිරීමේ හැකියාව වැළැක්වීම කළ හැකි ය.




# පරිගණක කෙවෙනි



# පාලන ඒකකය - Control Unit



# පරිගණකයක් බාහිර උපාංග සමග සම්බන්ධ කරන කෙවෙනි



# PS2 කෙවෙනිය

## මුසිකය සඳහා





## යතුරුපුවරුව සඳහා





# VGA කෙවෙනිය







VGA සම්බන්ධකය සහිත සංදර්ශක සඳහා

# DVI කෙවෙනිය










**DVI සම්බන්ධකය සහිත සංදර්ශක සඳහා**

# HDMI කෙවෙනිය






- සංදර්ශකය සඳහා රූපවාහිනියක් සම්බන්ධ කරන විට යොදා
- ගත හැකිය.
- මෙම රැහැන් මඟින් ශ්‍රව්‍ය සහ දෘශ්‍ය ආදාන සහ ප්‍රතිදාන කළ හැකිය.

# USB කෙවෙනිය






**පරිගණකයට සම්බන්ධ කළ හැකි USB වර්ගයේ සම්බන්ධක සහිත උපාංග සඳහා**








# Parallel කෙවෙනිය





මුද්‍රකය සඳහා බොහෝ විට භාවිත වේ.
එහෙත් නවීන මුද්‍රකවල ඇත්තේ **USB** සම්බන්ධක
රැහැන් නිසා නවීන පරිගණකවලින් මෙම කෙවෙනිය
ඉවත් කර ඇත.

# RJ45 ඊතනෙට් කෙවෙනිය











**පරිගණක ජාලගත කිරීමට යොදා ගන්නා RJ45 සම්බන්ධක සහිත රැහැන් සඳහා**

# HD Audio කෙවෙනිය



ස්පීකරය

මයික්‍රොෆෝනය

# SD Card Reader කෙවෙනිය






**SD Card කියවීම සඳහා භාවිත කෙරේ.උකුළ පරිගණක ටැබ් වැනි උපකරණවල දක්නට ලැබේ**



# පරිගණකවල මූලික දෝෂාවේක්ෂණය සහ නඩත්තුව




# දෘඪාංග දෝෂ

# පරිගණක ආශ්‍රිත දෝෂ




- දෘඩාංග දෝෂ
- මෘදුකාංග දෝෂ
  - යෙදුම් මෘදුකාංග දෝෂ
  - මෙහෙයුම් මෘදුකාංග දෝෂ



# දෘඪාංග (Hardware) දෝෂ

පරිගණකයට සම්බන්ධ කර ඇති විවිධ උපාංගවල දෝෂ ගවේෂණය කරනු ලබයි.



# දෘඪාංග දෝෂ සඳහා උදාහරණ

- පරිගණකය ක්‍රියාත්මක නොවීම
- යතුරුපුවරුව (Keyboard) ක්‍රියාත්මක නොවීම
- මූසිකය (Mouse) ක්‍රියාත්මක නොවීම
- සංදර්ශකය (Monitor) ක්‍රියාත්මක නොවීම
- නාදකය (Speakers) ක්‍රියාත්මක නොවීම
- ජාලය හා සම්බන්ධ නොවීම

# දෝෂය 1

පරිගණකය බල ගැන්වීමේ බොත්තම (Power Button) එබූ විට පරිගණකය ක්‍රියාත්මක නොවීම


# විසඳුම 1



පරිගණකයට විදුලිය සපයන ප්‍රධාන කෙවෙනියේ සිට පරිගණකය දක්වා විදුලිය සපයන රැහැන් සහ සම්බන්ධක නිවැරදිව සම්බන්ධ කර ඇති දැයි පරීක්ෂා කිරීම.


# අනුගමනය කළයුතු පියවර


## පියවර 1



බිත්තියේ ප්‍රධාන සැපයුමෙන් විදුලිය විසන්ධි කරන්න.


# පියවර 2





ප්‍රධාන සැපයුමෙන් එන රැහැන්, පරිගණකයට සහ සංදර්ශකයට හොඳින් සම්බන්ධ වී ඇති දැයි පරීක්ෂා කරන්න.එසේ නොමැති නම් හොඳින් සම්බන්ධ කරන්න.

# පියවර 3



ඉහත සඳහන් සියල්ල නිවැරදි නම් ප්‍රධාන සැපයුමෙන් විදුලිය සන්ධි කරන්න.

# පියවර 4



ඉන් පසුව පරිගණකය බල ගන්වන්න.බොහෝ විට පරිගණකය ක්‍රියාත්මක විය හැකිය.තව දුරටත් පරිගණකය බල ගැන්වීම කළ නොහැකි නම් කාර්මික ශිල්පියෙකුගේ සහය ලබා ගන්න.

# දෝෂය 2


යතුරුපුවරුව(Keyboard) හෝ මූසිකය(Mouse) ක්‍රියාත්මක නොවීම

# විසඳුම 1

- පරිගණකය නැවත ආරම්භ කරන්න.
- නව ඇරඹුමේ දී අක්‍රිය වී තිබූ යතුරුපුවරුව හෝ මූසිකය ක්‍රියාත්මක දැයි බලන්න.බොහෝ විට ක්‍රියාත්මක වේ.
- එසේ නොමැති නම් පහත ක්‍රියාකාරකම කරන්න.

# අනුගමනය කළයුතු පියවර


## පියවර 1





පරිගණකය Shutdown කරන්න.

# පියවර 2

USB ආකාරය නම්




PS 2 ආකාරය නම්



යතුරුපුවරුවේ සහ මූසිකයේ පේනු,කෙවෙනිවලට නිසියාකාරව සම්බන්ධ වී ඇති දැයි පරීක්ෂා කිරීම.

# දෝෂය 3




# සංදර්ශකය (Monitor) ක්‍රියාත්මක නොවීම

# විසඳුම 1

## අනුගමනය කළයුතු පියවර

### පියවර 1

සංදර්ශකයේ පණගැන්වීමේ බොත්තම ක්‍රියාතමක කර තිබේ දැයි බලන්න.එසේ නොමැති නම් ක්‍රියාතමක කරන්න.එවිට ද සංදර්ශකය ක්‍රියාත්මක නොවේ නම් පහත පියවරට යන්න.


# පියවර 2





- පරිගණකය නැවත ආරම්භ කරන්න.නව ඇරඹුමේ දී අක්‍රිය වී තිබූ සංදර්ශකය ක්‍රියාත්මක දැයි බලන්න.
- එසේ නොමැති නම් සම්බන්ධ නිවැරදි දැයි පරීක්ෂා කිරීමට පහත පියවර අනුගමනය කරන්න.

# පියවර 3

පරිගණකයේ සංදර්ශකයට දත්ත සපයන රැහැන් වර්ගය හඳුනාගෙන නිවැරදි කෙවෙනියට හොඳින් සම්බන්ධ කරන්න.ඒවා **VGA,DVI** හෝ **HDMI**විය හැක.



# පියවර 4



සංදර්ශකයට විදුලිය සපයන රැහැන පහත
දැක්වෙන ආකාරයට නිවැරදිව සම්බන්ධ
වී ඇති දැයි පරීක්ෂා කර බලන්න.

# පියවර 4



ඉහත පියවර සියල්ල නිවැරදිව අවසන් කළේ නම් පරිගණකය නැවත පණ ගැන්වූ විට බොහෝ දුරට සංදර්ශකය ක්‍රියාතමක වනු ඇත.එසේ නොවුණහොත් ඔබේ සංදර්ශකයේ දොෂයක් තිබේ දැයි දැන ගැනීම සඳහා වෙනත් සංදර්ශකයක් සම්බන්ධ කර බලන්න.එවිට ද ක්‍රියාත්මක නොවන්නේ නම් කාර්මික ශිල්පියෙකුගේ සහාය ලබා ගත යුතු වේ.

# දෝෂය 4



# නාදකය (Speakers) ක්‍රියාත්මක නොවීම

# විසඳුම 1


## පියවර 1

නාදකවල ඇති ශබ්ද පාලකය මඟින් ශබ්දය අවම කර ඇති දැයි බලා එය උපරිමය දෙසට කරකවන්න.



# පියවර 2

## පරිගණක මෙහෙයුම් පද්ධතිය මඟින් ශබ්දය අවම කර හෝ අක්‍රිය කර හෝ ඇති දැයි බැලීම




- ඔබගේ පරිගණක තිරයේ යට කෙළවරේ ඇති Task Barඑකෙහි දකුණු කෙළවරේ ඇති නාදකයක රූපය මත දෙවරක් ක්ලික් කිරීමෙන් හඬ පාලකය ලබාගත හැකි ය.


## දෝෂය 5





## ජාලය හා සම්බන්ධ නොවීම

# විසඳුම 1




- **RJ45** සම්බන්ධකය නිවැරදි ව සිදු වී ඇති දැයි පරීක්ෂා කර බලන්න.ඒසේ නොමැති නම් නැවත නිවැරදිව සමබන්ධ කරන්න.
- නිවැරදිව සම්බන්ධ වූ විට ඊතනෙට් කවුළුවෙහි කුඩා විදුලි බුබුළක් දැල්වෙනු ඇත.

# විසඳුම 2




- ඉහත පියවර අනුගමනය කළ විට ද ජාලය සමබන්ධ නොවේ නම්, ඔබේ පරිගණක තිරයේ යට කෙළවයේ ඇති Task Bar එකෙහි දකුණු කෙළවරේ ඇති පරිගණකයක රූපය මත Right ක්ලික් කිරීමෙන් ලැබෙන මෙනුවේ “Troubleshoot Broblems” මත ක්ලික් කරන්න.
- එවිට මෙහෙයුම් පද්ධතිය මගින් දෝෂාවේක්ෂණය කර ජාල සම්බන්ධය නිවැරදි කර දෙනු ඇත.



# මෘදුකාංග දෝෂ

# මෘදුකාංග දෝෂ

- යෙදුම් මෘදුකාංග දෝෂ
- මෙහෙයුම් මෘදුකාංග දෝෂ

# යෙදුම් මෘදුකාංග


යම් කිසි කාර්යයල් පරිගණකය ආශ්‍රිතව ඉටු කර ගැනීම සඳහා යොදා ගන්නා මෘදුකාංග යෙදුම් මෘදුකාංග වේ.

උදා:

- වදන් සැකසීමේ මෘදුකාංග (Word Processing Software)
- පැතුරුම්පත් මෘදුකාංග (Spreadsheet Software)
- වෙබ් අතික්සුව (Web Browser)
- රූප සකස් කිරීමේ මෘදුකාංගය (Photo editing Software)

# යෙදුම් මෘදුකාංග දෝෂ

පරිගණකයේ ස්ථාපිත කර ඇති යෙදුම් මෘදුකාංග ආශ්‍රිතව ඇතිවන ගැටළු



# යෙදුම් මෘදුකාංග දෝෂ සඳහා උදාහරණ

- ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම
- විවෘත වුවද ප්‍රතිචාර නොදැක්වීම
- සම්පූර්ණ අතුරු මුහුණත නොපෙනීම
- විවෘත වීමට බොහෝ වේලාවක් ගැනීම සහ ඉතා මන්දගාමී වීම
- පරිශීලක විධාන මත ක්‍රියාත්මක නොවීම
- මෙහෙයුම් පද්ධතිය නිසියාකාරව ක්‍රියාත්මක නොවීම

# විසඳුම 1

මෘදුකාංගය වසා දමා (Close) නැවත විවෘත කිරීම සිදු කිරීම.

# විසඳුම 2

- මෘදුකාංගය ඔබගේ පරිගණකයේ පිරිවිතරවලට සහ මෙහෙයුම් පද්ධතියට අනුකූල දැයි (Compatible) විමසා බලන්න.
- පරිගණකවල සමහර මෘදුකාංග එක පරිගණක පරිසරයකට අනුකූල විය හැකි අතර වෙනත් පරිසරයකට අනුකූල නොවිය හැකිය.

# විසඳුම 3

- මෘදුකාංගය බලපත්‍ර සහිත මෘදුකාංගයක් ද යන්න විමසා බලන්න.
- බලපත්‍ර නැති හෝ බලපත්‍ර කාලය නිම වූ මෘදුකාංග භාවිතයේ දී ගැටළු ඇති වේ.

# විසඳුම 4

- යෙදුම් මෘදුකාංගය පිළිසකර (Repair) කරන්න.
- ඉන් පසු පරිගණකය නැවත ආරම්භ (Restart) කර මෘදුකාංගය විවෘත කර බලන්න.

# විසඳුම 5

පරිගණකයේ ස්ථාපිත කර ඇති අක්‍රිය වූ මෘදුකාංගය අස්ථාපනය (Uninstall) කර නැවත ස්ථාපනය (Install) කරන්න.

# විසඳුම 6


- වෛරස මගින් ඇති කරන බලපෑම මත ද දෝෂ ඇති විය හැකිය.
- ඒ සඳහා ප්‍රතිවයිරස (Anti-Virus) මෘදුකාංගයක් මගින් පරිගණකය සුපරීක්ෂණය (Scan) කරන්න.
- ඉන් පසු පරිගණකය නැවත ආරම්භ (Restart) කර මෘදුකාංගය විවෘත කර බලන්න.




# මෙහෙයුම් මෘදුකාංග දෝෂ

# මෙහෙයුම් පද්ධතිය

මෙහෙයුම් පද්ධතිය යනු පරිශීලකයා හා පරිගණකය අතර සම්බන්ධතාව ඇති කරන මෘදුකාංගයකි (Software).



වින්ඩෝස් (Windows)

ෆෙඩෝරා (Fedora)


ඇපල් මැකින්ටොෂ් (Apple Macintosh)

MS ඩොස් (Microsoft DOS)

උබුන්ටු (Ubuntu)

# මෙහෙයුම් මෘදුකාංග දෝෂ

## පරිගණකයේ ස්ථාපිත කර ඇති මෙහෙයුම් පද්ධතිය ආශ්‍රිතව ඇතිවන ගැටළු



# මෘදුකාංග දෝෂ සඳහා උදාහරණ

- ❖ පරිගණකය ආරම්භ වීමට බොහෝ වේලාවක් ගතවීම
- ❖ සියලු ම කාර්යයන් ඉතා මන්දගාමී වීම
- ❖ පරිශීලක විධාන මත ක්‍රියාත්මක නොවීම
- ❖ ආරම්භක තිරය (Desktop) හිස්වීම

# දෝෂය 1




## පරිගණකය මන්දගාමී වීම

# විසඳුම 1

ආරම්භක වැඩසටහන් (Startup Program) අතරින් අවශ්‍ය නොවන වැඩසටහන් ඉවත් කරන්න.එවිට පරිගණකය ආරම්භවීමේ වේගය වැඩි වේ.



# විසඳුම 2

අනවශ්‍ය ගොනු ඉවත් කරන්න.මේ සඳහා මෙමෙහෙයුම් පද්ධතියේ ඇති Disk Cleanup මෙවලම භාවිත කල හැකි ය.



# විසඳුම 3

ඉහත සියල්ල කළ පසුත් ප්‍රතිඵලයක් නොලැබේ නම්,මෙමෙහෙයුම් පද්ධතිය පිළිසකර (Repair) කරන්න.





# විසඳුම 4

එය ද අසාර්ථ නම් මෙමෙහෙයුම් පද්ධතිය ප්‍රතිස්ථාපනය (Re-install) කරන්න.



# දෝෂය 2





ආරම්භක තිරය (Desktop) හිස්වීම

# විසඳුම 1


## පියවර 1

පරිගණක තිරයේ task bar එකෙහි දකුණු කෙළවර ඇති (වේලාවට දකුණින්) කථන බැලුම (speech balloon) මත ක්ලික් කරන්න.



# පියවර 2

එවිට Windows action center විවෘත වේ. එහි පහත සෘජුකෝණාස්‍රාකාර බොත්තම් කිහිපයක් දිස්වේ. එම බොත්තම් අතරින් Tablet mode බොත්තම මත ක්ලික් කිරීමෙන් Tablet ආකාරයෙන් PC ආකාරයට මාරුවිය හැකි ය. එසේ PC ආකාරයට මාරු වූ විට desktop icons නැවත දිස් වනු ඇත.



# ස්තූතියි !

පාඩම මෙහෙයවීම : ජී.එන්.ප්‍රසන්ති
ඒ.එම්.අයි.යූ.අරම්පොළ
කේ.ජී.ඔ.රුෂිකා (සීමාවාසි )

ර/ඇඹි/චන්ද්‍රිකාවැව ජයන්ති මහ විද්‍යාලය - 8 ශ්‍රේණිය